ලංකා ධීවර සංස්ථාව - 2012

--------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1** **මතය ව්‍යාවනය**

------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

--------------------------------------------------------

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතට අනුව, ලංකා ධීවර සංස්ථාව නිශ්චිත ව්‍යාපාර ගණයට ඇතුළත් වන අතර, මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (LKAS) අනුකූලව 2012 ජනවාරි 01 දින සිට බලපවත්වන පරිදි පිළියෙල කළ යුතු වුවත්, විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය එම ප්‍රමිතිවලින් බැහැරව තිබුණි.

**1.2.2** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

--------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස දෙකක ප්‍රමාදයකින් පසුව 2013 මැයි 08 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**1.2.3** **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම වගකීම්වල ඇතුළත් කළයුතු රු.90,872,046 ක්වූ බැංකු අයිරාව ජංගම වත්කම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ආ) වසර 05 ක කාලසීමාවක් සඳහා සංස්ථාව විසින් බද්දට ලබාගත් ඉඩම්වල අලෙවිසල් ස්ථාපිත කිරීම වෙනුවෙන් වැයකර තිබුණු පිරිවැය ප්‍රාග්ධනිත කිරීම හේතුකොටගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම නොවන වත්කම්හි අගය රු.27,276,238 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සේවක පාරිතෝෂික රු.7,762,590 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වූ සංඛ්‍යා හා ඒ සඳහා ඉදිරිපත් කළ උපලේඛන අතර රු.11,770,371 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛණය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පාරිතෝෂික ගෙවීම් | 9,197,861 | 1,435,271 | 7,762,590 |
| වෙළඳ ණය හිමියෝ | 231,717,220 | 235,725,001 | 4,007,781 |
| | | | 11,770,37 |

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද ණය හිමි කාල විශ්ලේෂණය අනුව දීර්ඝ කාලයක සිට ගෙවීමට ඇති ණය ශේෂවල එකතුව රු.235,725,001 ක් වූ අතර ඉන් රු.25,326,266 ක් වර්ෂ 4 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ශීතාගාර කුලියට දීමෙන් විධායකවලින් රු.22,272,564 ක්ද හා බාහිර පාර්ශවයන්ගෙන් රු.7,799,229 ක්ද වශයෙන් එකතුව රු.30,071,793 ක් සංස්ථාවට අයවිය යුතු ණයගැති ශේෂ විය. එම මුදල් අයකර ගැනීම සඳහා සක්‍රීය වැඩපිළිවෙලක් සංස්ථාව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ණය පදනම මත රෝහල් සඳහා මසුන් සැපයීමෙන් අයකර ගැනීමට රු36,707,887 ක ණයගැති ශේෂයක් විය. එම ණය අයකර ගැනීම සඳහා සක්‍රීය වැඩපිළිවෙළක් සංස්ථාව ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් වටිනාකම රු.1,013,502,501 ක් වූ පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | ගිණුම් විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබියයුතු ගිණුම් | 382,069,023 | උපලේඛනය |
| (ආ) | ගෙවිය යුතු ගිණුම් | 473,753,650 | උපලේඛනය |
| (ඇ) | ස්ථාවර තැන්පතු | 200,000 | තැන්පතු සහතික |
| (ඈ) | අපහරණය කළයුතු වත්කම් | 5,202,867 | උපලේඛනය |
| (ඉ) | වෙනත් ආයෝජන | 110,376,603 | ආයෝජන සහතික හා උපලේඛනය |
| (ඊ) | ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂ | 17,363,485 | උපලේඛනය |
| (උ) | අනෙකුත් විධායකයන් | 24,536,873 | විස්තරාත්මක උපලේඛනය |
| | | 1,013,502,50 | |

**1.2.7. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | එක් කාර්තුවක් අවසාන වී ඊළඟ මාසයේ 20 වන දින හෝ ඊට පෙර එකතු කළ අගය මත වූ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.27,865,289 ක් වූ බදු මුදල් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | නියමිත දිනට ආර්ථික සේවා ගාස්තු නොගෙවීම හේතුකොටගෙන 2010/2011 වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු.1,843,905 ක දඩ මුදලක් නියම කර තිබුණි. |
| (ඇ) | 2010 දෙසැම්බර් 31 දිනැති අංක 26/2010 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය. | 2011 ජුනි 01 දින සිට එක් අවුරුදු කාලයකට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත අලෙවි කළමනාකරුවකු බඳවා ගෙන තිබුණි. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| | (i) 8.3.9 වගන්තිය | රේඛීය අමාත්‍යාංශය සතු වාහන දෙකක් සඳහා පිළිවෙලින් රු.171,531 හා රු.456,671 ක ඉන්ධන වියදමක් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවා තිබුණි. |
| | (ii) 9.4 වගන්තිය | සංස්ථාවේ නිලධාරීන් 13 දෙනෙකු අමාත්‍යාංශවලටත්, කාර්යාලයකට හා එක් ආයතනයකට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එම නිලධාරීන් වෙනුවෙන් වැටුප්, අතිකාල දීමනා, සේ.අ.අ. දායක හා සේ.නි.භා.අ. දායක ලෙස එකතුව රු.2,582,549 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. |
| | (iii) 8.3.6 වගන්තිය | ජලය, විදුලිය හා ඉන්ධන වියදම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරුවන්ගේ පාලනය හා අධීක්ෂණය යටතේ විධිමත් පාලන ක්‍රමවේදයක් යොදාගෙන නොතිබීම හේතුවෙන් බිල්පත් නිසි පරිදි නොගෙවීම නිසා එකතුව රු.618,904 ක අධිභාර හා දඩ පොලී සංස්ථාව ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2006 දෙසැම්බර් 18 දිනැති අංක ඩීඑම්එස්/සී/3/එෆ්ආර්/8 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ IV ඡේදය | සංස්ථා නිලධාරීන් සඳහා 2006 ජනවාරි සිට අතුරු දීමනා ගෙවීම නතර කළයුතු වුවත්, ඉංජිනේරු සේවය සඳහා දීමනා ලෙස එකතුව රු.180,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 ඡේදය | වටිනාකම රු.1,847,413 ක් වූ පරිගණක හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.41,763,563 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.68,969,869 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,206,306 ක ඌණතාවයේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් මසුන් අලෙවිය, අයිස් අලෙවිය හා ටින්කල මසුන් අලෙවිය වැඩිවීම හේතු වී තිබුණි.

### 2.2 මෙහෙයුම් කටයුතුවල ලාභදායීත්වය

------------------------------------

සංස්ථාව පසුගිය වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර සංසන්දනාත්මක විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | අලාභය | පෙර වර්ෂයට සාපේක්ෂව අලාභ වර්ධනයේ ප්‍රතිශතය |
|---|---|---|
| | රු. මිලියන | % |
| 2008 | (56.175) | 516 |
| 2009 | (103.889) | 85 |
| 2010 | (59.424) | (43) |
| 2011 | (68.970) | 16 |
| 2012 | (41.764) | (39) |

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

-----------------------------------

කාර්යක්ෂම ආයතනයක තිබිය යුතු ජංගම අනුපාතය 2 : 1 ක් වියයුතු වුවත්, සංස්ථාවේ ජංගම අනුපාතය 0.66: 1 ක් වීම හේතු කොටගෙන කාරක ප්‍රාග්ධන දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී තිබුණි. ඊට ප්‍රධාන වශයෙන් බැංකු අයිරාවක් පැවතීම, කෙටි කාලීන ණය විශාල වශයෙන් ලබා ගෙන තිබීම හා ගෙවීමට ඇති වෙළඳ හා අනෙකුත් දෑ විශාල අගයක් ගෙන තිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. සංස්ථාවේ පැවතිය යුතු ක්ෂණික වත්කම් අනුපාතය 1:1 ක් විය යුතු වුවත්, එය 0.5:1 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

ලංකා බැංකුවේ පවත්වාගෙන ගිය ජංගම ගිණුම් 08 ක් අක්‍රියව පැවති අතර දිගුකාලීනව අක්‍රීයව පැවති ශේෂය රු.789,771 ක් වී තිබුණි. මෙම අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

සංස්ථාව සතු පිරිවැය රු.954,950 ක්වූ කාර්මික දෝෂයන්ට ලක්වී තිබූ වාහනයක් වසර 04 ක පමණ කාලයක සිට අළුත්වැඩියාවන් නොකර සංස්ථා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

**3.3 හඳුනාගන්නා ලද පාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෛනික අලෙවියෙන් ලැබී තිබුණත් සංස්ථාවට භාරදී නොතිබුණු මුදල්වල වටිනාකම රු.90,096 ක් වූ අතර එම මුදල් ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා මිලදී ගෙන තිබූ රු.72,540 ක් වටිනා විදුලි උපකරණ ආපසු භාරදී නොතිබුණි.

**3.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්**

**------------------------------------------------------------**

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකු සඳහා එකතුව රු.336,000 ක දීමනා සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවා තිබුණි.

**4. පද්ධති හා පාලනයන්**

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) මසුන් මිලදී ගැනීම හා අලෙවි කිරීම

(ආ) ගෙවීම් පාලනය

(ඇ) ආදායම රැස්කිරීම

(ඈ) ගිණුම්කරණය

(ඉ) ස්ථාවර වත්කම් පාලනය

(ඊ) කාර්ය මණ්ඩල පාලනය